රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 26/2023

මගේ අංකය : EST-3/04/POL/0064
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2023.12.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන් සඳහා සහනයක් ලබා දීම.</u>**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දින නියමයක් නොමැතිව කල් තැබීම හේතුවෙන් නාමයෝජනා භාරදෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට සහන සලසමින් නිකුත් කරන ලද 2023.04.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2023 හා 2023.05.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2023 ට අමතරව පහත සඳහන් සහන ලබා දීමට 2023.12.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව,

අ. පළාත් පාලන බල ප්‍රදේශයෙන් පිටත සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු කිරීම හේතුවෙන් දුෂ්කරතාවට පත් දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයකු ඒ සම්බන්ධව අභියාචනය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ පිළිබඳ සලකා බලා සේවා ස්ථානයේ දේශපාලන කාර්යයන්වල හෝ දේශපාලන ප්‍රචාරණ, ප්‍රවර්ධන කාර්යයන්වල හෝ නිරත නොවෙමින් කටයුතු කරන බවට එම නිලධරයන්ගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අනතුරුව තමාගේ ස්ථිර සේවා ස්ථානයට වාර්තා කිරීමට ඉඩ සලසා දිය යුතු ය.

ආ. 2023.04.25 දින සිට 2023.05.08 දින තෙක් කාලය වැටුප් සහිත නිවාඩු සේ සලකමින් මූලික වැටුප ගෙවිය යුතු ය.

ඇ. 2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2023 අනුව අනිවාර්යයෙන් සේවයට වාර්තා කළ යුතු ය.

03. ඉහත (අ) ට අනුව අදාළ සියලු අභියාචනා කටයුතු 2024.01.22 දින වන විට අවසන් කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මැතිවරණ කොමිෂන් සභාවේ ද එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

කේ.ඩී.එන් රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය : 011-2692159
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-iii@pubad.gov.lk